# තාන්ත්‍රික බුදුසමයාගත පඤ්චධ්‍යානීබුද්ධ සංකල්පය

ඕපාත සමිත හිමි[1]

## Abstract

The concept of pañca dhyānī Buddha, or the concept of pañca Jina, can be introduced as a Tantric teaching that emerged as a result of the development of Tantrayāna teachings. Through this Tantric concept, which is well-renowned in the Western world. It symbolically explains all living and non-living world in the universe. Other Buddhist traditions generally presented their teachings openly and popularly, while the Vajrayāna tradition secretly introduced its teachings. Here, they used a symbolic language to introduce their teaching, and they protected its secretive nature. According to this, the concept of pañca dhyānī Buddha means investigating the universe in a symbolic way. This symbolises five Buddhas concentrated in meditation. Initializing that they have used symbols: directions, casts, colours, mudrā, vehicles, symbols, aggregates, roots, letters symbol, they introduced Vajrayāna teachings in a more secretive manner. It provides a gateway to understanding the cosmology taught in Tantric Buddhism through the concept of Pañca dhyānī Buddha. Therefore, this study aims to examine the development and nature of the Pañca dhyānī Buddha concept within Tantric Buddhism. For this purpose, it is intended to utilise primary and secondary sources under the qualitative research methodology.

**Keywords:** Mahāyana, Maṇdala, Pañca dhyāni Buddha, Tantrayāna

1 උපශාලාධිපති, ප්‍රඥාසාර හික්ෂු නේවාසිකාගාරය, කැලණිය විශ්වවිද්‍යාලය.

**පර්යේෂණ ගැටලුව**

තන්ත්‍රයානය තුළ පඤ්චධ්‍යානීබුද්ධ සංකල්පයේ සංවර්ධනය හා එහි ස්වභාවය කෙසේ සිදු වී තිබේ ද?

**පර්යේෂණ අරමුණ**

තන්ත්‍රයානය තුළ පඤ්චධ්‍යානීබුද්ධ සංකල්පයේ ක්‍රමික සංවර්ධනය හා එහි ස්වභාවය හඳුනා ගැනීම.

**සාහිත්‍යය විමර්ශනය**

මෙම පර්යේෂණයේ පදනම තාන්ත්‍රික පඤ්චධ්‍යානීබුද්ධ සංකල්පයයි. පඤ්චධ්‍යානීබුද්ධ සංකල්පය ගැඹුරින් අධ්‍යයනය කිරීමෙන් එහි ගැබ්ව ඇති තාන්ත්‍රික ගුඪාර්ථයන් කවරේද යන්න මෙහිදී වැඩිදුරටත් විමර්ශනය කෙරේ. උක්ත පර්යේෂණ පථය සම්බන්ධයෙන් මහායාන හා තාන්ත්‍රික මූලග්‍රන්ථයන්හි මෙන් ම ඉංග්‍රීසි භාෂාවෙන් රචනා වූ පශ්චාද්කාලීන ද්විතීයික මූලාශ්‍රය තුළ කරුණු වැඩි වශයෙන් සඳහන් ව තිබුණ ද සිංහල භාෂාවෙන් රචනා වූ ග්‍රන්ථයන්හි කරුණු සඳහන් ව ඇත්තේ ඉතා අල්ප වශයෙනි. තත් කෘති තුළ ද පඤ්චධ්‍යානීබුද්ධ සංකල්පය පිළිබඳ හමුවන්නේ කෙටි විස්තර පමණි. එබැවින් මෙම පර්යේෂණය මඟින් පඤ්චධ්‍යානී බුදුවරුන් පිළිබඳ ව මෙන් ම එම සංකල්පය තුළින් ප්‍රකාශිත විවිධ අර්ථයන් ද අධ්‍යයනය කෙරේ. පඤ්චධ්‍යානීබුද්ධ සංකල්පය සම්බන්ධයෙන් මොරටුවේ සාසනරතන හිමියන් (1952) ලක්දිව මහායාන අදහස් කෘතියේදී දක්වන ලද කෙටි විවරණයක් හමුවේ. එමෙන් ම මහාචාර්ය නාඔටුන්නේ විමලඤාණ හිමියන් (2014) තාන්ත්‍රික බුදුසමය නම් කෘතියෙහි පඤ්චධ්‍යානී බුද්ධ සංකල්පය පිළිබඳවත් ඉන් ප්‍රකාශිත දාර්ශනික පසුබිම පිළිබඳවත් කරුණු ඉදිරිපත් කොට ඇත. මීට අමතර ව මඩිහේ සුගතසිරි හිමියන් (2017) උතුරු බුදුදහම නම් කෘතියෙහි පඤ්චධ්‍යානී බුදුවරුන් පිළිබඳ ව වෙන වෙන ම කෙටි විවරණ දක්වා ඇත. Paul Williams (2012) විසින් රචිත Buddhist Thought A Complete Introduction to the Indian Tradition කෘතියෙහි පඤ්චධ්‍යානී බුද්ධ සංකල්පය පිළිබඳවත් ඉන් ප්‍රකාශිත ගුඪාර්ථයන් හා මණ්ඩල පිළිබඳවත් කරුණු වාර්තා කොට ඇත.

## පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ කරුණු අධ්‍යයනය කරන ලද මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයාගත කරුණු යොදාගැනීමට අපේක්ෂිත ය.

## උපන්‍යාසය

පඤ්චධ්‍යානීබුද්ධ සංකල්පය වනාහි බුද්ධ පරිනිර්වාණයත් සමඟ පශ්චාත්කාලීන ව බෞද්ධ ගුරුකුලයන් විසින් ක්‍රමික ව ගොඩනගන ලද්දකි. විශේෂයෙන් මහායානයේ දක්වන අසීමිත බුදුවරුන් විශ්වයේ වැඩසිටී යන අදහස වෙනස් කරමින් තන්ත්‍රයානය තුළ එය සංඛ්‍යාත්මක ව අඩුකොට දක්වා ඇත. එමෙන් ම මෙම සංකල්පය දියුණු කිරීම මඟින් තන්ත්‍රයානිකයන් මූලික වශයෙන් අපේක්ෂා කරන ලද්දේ විශ්වය තුළ පවත්නා ගැඹුරුවූත් සංකීර්ණවූත් ස්වභාවය ගූඪාර්ථයෙන් පෙන්වා දීමයි.

## ප්‍රවේශය

ක්‍රි. පූ. හයවන සියවසේ දී ආරම්භ වූ බෞද්ධ චින්තනය බොහෝ විභජනයන්ට හා වෙනස්කම්වලට ලක්වෙමින් සියවස් ගනණාවක් පුරාවට අවිච්ඡින්න ව පැවතෙයි. මෙම සියවස් ගණන පුරාවට ධර්ම කරුණු පදනම් කර ගනිමින් සංකල්පමය වශයෙන් භික්ෂූන් බෙදී වෙන් වූවා පමණක් නොව එම සංකල්පයන් වඩාත් තහවුරු කර ගැනීමට හා ව්‍යාප්ත කිරීමට නව බෞද්ධ ගුරු කුලයන් ද නිර්මාණය කර ගන්නා ලදී. එසේ බුද්ධ පරිනිර්වාණයත් සමඟ ක්‍රමික ව සංවර්ධනය වූ ප්‍රධාන අදහසක් වශයෙන් බුද්ධ සංකල්පය හඳුන්වා දිය හැකි ය. බුද්ධ පරිනිර්වාණයත් සමඟ කෙලෙස් ප්‍රහීන නො කරන ලද භික්ෂූන්ට එය එතරම් පහසු වූවක් නොවීය. කල්යත් ම ඔවුහු තම ශාස්තෘන් වහන්සේගේ මතකය අමතක වී යාමට ඉඩ නො දී සර්වකාලීන වූ සර්ව ව්‍යාපී වූ අසහාය බුද්ධ චරිතයක් නිර්මාණය කරන්නට ප්‍රයත්න දැරීය. මෙම නො නැසෙන නො සැලෙන අසහාය වූ ස්වරූපය බුද්ධත්වය විෂයෙහි ආරෝපණය කිරීමෙහිලා මහාසංඝික නිකායත් ඔවුන්ගෙන් ම බිඳී ගිය තවත් ශාඛාවක් වන ලෝකෝත්තරවාදීහුත්

විශාල දායකත්වයක් ලබා දුන්හ. මෙහි ලෝකෝතතරවාදීන්ගේ ප්‍රධාන බුද්ධ චරිතය විෂය කොට ගත් මූලාශ්‍රය ග්‍රන්ථයක් වන මහාවස්තුව තුළ බුදුරදුන්ගේ චර්යාව, ඉරියව් පමණක් නොව ගුණ ද ලෝකෝත්තර බව දක්වා ඇත. සම්මුති ලෝකය තුළ උන්වහන්සේ ජලස්නානය කළ ද ඒ කිසිදු දුහුවිල්ලක් නැවරීම නිසා සිදුකරන ලද්දක් නො ව සැබැවින් ම එය ලෝක සම්මතයට අනුගත වීම පිණිස පමණක් සිදුකරන ලද්දකි. ස්වර්ණමය පිළිමයක් බඳු බුද්ධ ශරීරයට කිසිදු රෝගාබාධක් නො වැළඳේ. නමුත් මහාවස්තුවට අනුව තථාගතයන් වහන්සේ විධිධ රෝග ාබාධ සඳහා ඖෂධ යොදාගෙන ඇත්තේ ලෝක සම්මුතියට අනුගත වීම සඳහාත් සැදැවතුන්ට අනුග්‍රහය සඳහා පමණි.

බුද්ධ සංකල්පය සම්බන්ධයෙන් ලොකෝත්තරවාදීන් දක්වන ලද මෙම මතය ථෙරවාදයට අතිශයින් ම පටහැනි ය. මහායානය තුළ බුද්ධත්වය ආශ්චර්යවත් හා අද්භූත ස්වභාවයක් වශයෙන් ඉස්මතු කොට දැක්වීමට උත්සාහ ගෙන තිබුණ ද ථෙරවාදයේ බුද්ධ සංකල්පය විස්තර ව ඇත්තේ සාමාන්‍ය මනුෂ්‍යයෙකුට උරුම වන ඉපදීම, වයසට යෑම, රෝගාබාධයන්ට ගොදුරු  වීම ආදියට මුහුණ දීමට සිදු වූ සාමාන්‍ය තත්වයක් වශයෙනි (දී. නි. i, 2005: පි. 196). පරිනිර්වාණය පිණිස කුසිනාරාවට වඩින බුදුරදුන්ට අත්විඳීමට සිදු වූ බොහෝ සිදුවීම් පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් මහාවස්තුවේ අවධාරිත පරිදි අසහාය ආශ්චර්යවත් ස්වභාවයක් බුද්ධත්වය සම්බන්ධයෙන් ථෙරවාදයේ විස්තර ව නොමැති බව හඳුනාගත හැකි ය. චුන්දකර්මාර පුත්‍රගේ භොජුන් වැළඳූ බුදුරදුන්ට මරණය කෙළවර කොට ඇති ඉතා දැඩි වේදනා ගෙන දෙන ලෝහිතපක්ඛන්දිකා  නම් රෝගයක් වැළඳුන ද එම වේදනාව උන්වහන්සේ ගුණ නුවණින් ඉවසා වැඩ සිටියේ රෝගී වීම බුද්ධ විෂයෙහි ද සාධාරණ බව ලෝකයාට පෙන්වාදීම පිණිස ය ( දී. නි. i, 2005: පි. 200). අසූ වියැති බුදුරදුන් කුසිනාරාවට වඩින අතරමගදී වරක් දැඩි පිපාසයකින් පෙළෙන ලද්දේ තෙවරක් ම ආනන්ද තෙරුන්ගෙන් පැන් ගෙන එන ලෙස දැන්වූ සේක. පිපාසය, බඩගින්න වැනි ඉතා සරල මානව අවශ්‍යතා ද ථෙරවාදයට අනුව තථාගතයන් වහන්සේ විෂයෙහි සාධාරණ බව මෙමඟින් ද විද්‍යමාන වන කරුණකි. කෙසේ වෙතත් ථෙරවාදයේ මූලික සූත්‍ර දේශනා තුළ විස්තර ව ඇති බුද්ධ සංකල්පය පශ්චාත්කාලීන බෞද්ධ ගුරු කුල

ආශ්චර්යවත් ස්වභාවයක් වශයෙන් විස්තර කිරීම යුග කිහිපයක් තුළ ඉතා පැහැදිලි වෙනස්කම් සහිත ව සිදුව ඇති අන්දම හඳුනාගත හැකි ය.

- මජ්ඣිම නිකායාගත අරියපරියේසන හා අංගුත්තර නිකායේ දේවදූත වර්ගයේ සූත්‍රයන්හිදී ඉතා පැහැදිලි ව බුදුරදුන් මනුෂ්‍යයෙකු වශයෙන් සඳහන්කර තිබීම මුල්යුගයට අයත් ය (ම. නි. i, 2005: පි. 394).
- බුද්ධ චරිතය වටා ආශ්චර්යවත් අද්භූත කරුණු ඇතුළත් මජ්ඣිම නිකායාගත අච්ඡරියබ්භූත සූත්‍රයත් සුත්ත නිපාතයේ පබ්බජ්ජා, නළකලාප වැනි සූත්‍රත් මෑත කාලීන යුගයට අයත් බුද්ධවංස, චරියාපිටක, අපදාන පාළි වැනි ග්‍රන්ථ රචනාවීමත් දෙවන යුගයට අයත් ය (ම. නි. iii, 2005: පි 286).
- ථේරවාද අටුවා යුගය (ධම්මජෝති හිමි, මැදවච්චියේ, 2011: පි. 63)

බුද්ධ පරිනිර්වාණයත් සමඟ නිර්මාණය වූ බෞද්ධ ගුරුකුලයන් බුද්ධ සංකල්පය වඩාත් ආකර්ෂණීය අන්දමින් ගොඩනැගීමට උත්සාහ ගෙන ඇති අතර ඉන් තන්ත්‍රයානයේ එන පඤ්චධ්‍යානීබුද්ධ සංකල්පයට ද හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. විශේෂයෙන් තන්ත්‍රයානය තුළ බුද්ධ සංකල්පය වඩාත් රහස්‍ය (ගුහ්‍ය) යන සංකේතාත්මක භාෂාවකින් ඉදිරිපත් කිරීමට උත්සාහ ගෙන තිබීම තන්ත්‍රයානයටම අනන්‍ය වූ ලක්ෂණයක් වශයෙන් හඳුනාගත හැකි ය. තන්ත්‍රයානයට අයත් ගුහ්‍ය සමාජ තන්ත්‍ර (තථාගත ගුහ්‍ය) නම් කෘතියෙහි පඤ්ච ජින සංකල්පය පිළිබඳව කරුණු සඳහන් වන අතර එහි විස්තරවන අන්දමට ලෝකයේ විචිත්‍රවත් සංකීර්ණ පැවැත්ම සංකේත පහක් යටතේ හඳුනාගත හැකි ය. මෙම සංකේත පහ විස්තාරණය කළ විට ඉන් සමස්ත ලෝකය නිරූපණය වනවා සේම එය සම්පිණ්ඩනය කළ විට සංකේත පහක් බවට පත්වේ. ඒ අනුව අප තන්ත්‍රයානය තුළ පඤ්ච ජින යනුවෙන් හඳුනාගනු ලබන්නේ ලෝකය පිළිබඳ ව සංකේතාත්මක ව කරන ලද මෙම විවරණයයි.

## පඤ්චධ්‍යානීබුද්ධ සංකල්පය

මහායාන බුද්ධ සංකල්පය වනාහි ක්‍රමික ව සංවර්ධනය වූවකි. තත් ඉගැන්වීම්වලට අනුව සමස්ත දසදිශාවන් බඹුළුවන බුද්ධ ක්ෂේත්‍රය අසීමාන්තික වන අතර බුදුවරුන්ගේ ප්‍රමාණය ද සංඛ්‍යාත්මක ව දැක්විය නො හැකි ය. මහායානය තුළ බෝධිසත්ත්වවරු අසීමාන්තික වන්නා සේම බුදුවරුන්ගේ සංඛ්‍යාව ද අසීමාන්තික ය. නමුත් ථෙරවාද මූලාශ්‍රය පරිශීලනය කිරීමෙන් එවැනි අසීමාන්තික බුදුවරු පිළිබඳ සඳහන් නොවුන ද දීඝනිකායගත මහාපදාන සූත්‍රය (දී. නි. ii, 2005: පි 04) තුළ බුදුවරුන් හත්නමක් පිළිබඳවත් ආටානාටිය (දී. නි. iii, 2005: පි. 312) සූත්‍රය තුළ බුදුවරුන් හත්නමක් පිළිබඳවත් සඳහන් වේ. බුද්ධත්වය පමණක් පරම නිෂ්ඨාව වශයෙන් සලකනු ලබන මහායාන ඉගැන්වීම්හි බෝධිසත්ත්වරු පිළිවෙළින් දශභූමි, අනුත්තර පූජා, දස ප්‍රණිධාන, ෂට් පාරමිතා යන මෙම අංගයන් අත්දැකීමෙන් පූරණය කොට බුද්ධත්වය ලැබිය යුතු ය. ප්‍රාථමික භූමියෙහි පිරිය යුතු සියලු ගුණධර්ම පුරා ක්‍රමයෙන් ධර්මමේඝා භූමියට පත්වන බෝධිසත්ත්වයන් බුද්ධත්වයට එසේත් නොමැති නම් නිර්වාණයට පත්වන අතර එම බුද්ධ භූමියෙහි ම පමණක් උන්වහන්සේ වැඩ සිටිති. මනුෂ්‍ය ලෝකයට උන්වහන්සේලා වැඩම වන්නේ සත්ත්වයා පාපාන්ධකාරයෙන් මුදවා ගැනීම සඳහා පමණි. තන්ත්‍රයානයට අනුව සත්ත්වයා පාපයන්ගෙන් මුදවා ගැනීම සඳහා කලින් කලට බුදුවරු පස්නමක් වැඩම කරවති. අප පඤ්ච ජින වශයෙන් හඳුන්වනු ලබන්නේ මෙම බුදුවරු පස්නම පිළිබඳ ව ය.

i. අමිතාභ බුදුන්වහන්සේ
ii. අක්ෂෝභ්‍ය බුදුන්වහන්සේ
iii. රත්නසම්භාව බුදුන්වහන්සේ
iv. අමෝඝසිද්ධි බුදුන්වහන්සේ
v. වෛරෝචන බුදුන්වහන්සේ

තාන්ත්‍රික ඉගැන්වීම් තුළ ඉහත දක්වන ලද පඤ්චධ්‍යානී බුදුවරුන් අතරට වජ්‍රසත්ත්ව යනුවෙන් තවත් එක් බුදුවරයෙක් දක්වන අතර එවිට බුදුවරුන්ගේ සංඛ්‍යාව හය නමක් බවට පත්වේ. මෙහි වජ්‍රසත්ත්ව

යනුවෙන් විස්තර ව ඇත්තේ වජ්‍රයෙහි උත්තරීතර ස්වභාවයයි. පස් බුදුවරුන් වජ්‍රසත්ත්ව බුදුරදුන් විසින් උපදවන ලබන අතර ලෝකයේ සියල්ල මැවීම සිදු කරනු ලබන්නේ ද මුන්වහන්සේ විසින්ම ය. එසේ ම තාන්ත්‍රික ඉගැන්වීම්වලට අනුව ශූන්‍යතාව හා විඥප්තිමාත්‍රතාව නියෝජනය කරනු ලබන්නේ ද වජ්‍රසත්ත්ව බුද්ධ සංකල්පය තුළිනි.

ධ්‍යානී බුදුවරුන් ශාරීරික වශයෙන් සමාන ලක්ෂණ ගෙන තිබුණ ද උන්වහන්සේලාගේ ශාරීරික ඉරියව්, හස්ත මුද්‍රා, අත දරා සිටින සංකේත හා වර්ණ හේතුවෙන් බාහිර ස්වරූපයේ සුවිශේෂී වූ වෙනස්කම් දැකිය හැකි ය. සෑම බුදුවරයෙක් ම නෙළුම් මල් දෙකක් මත භාවනානුයෝගී ස්වරූපයෙන් වැඩහිඳන අතර අත උකුල මත තබාගෙන සිටිති. ඇතැම් ප්‍රතිමාවල අතින් පාත්‍රයක් දරා සිටින ආකාරය දැකගත හැකි වුවත් ඇතැම් ප්‍රතිමා තුළ එවැනි කිසිවක් අතින් දරා සිටින ආකාරය දැකගත නො හැකි ය. ඍජුව පිහිටි හිසෙහි කෙස් රැළි ගැසී ඇත. එක් උරයක් පමණක් නිරාවරණය වන සේ සිවුරු පොරවා ඇති උන්වහන්සේලාගේ දෑස අඩවන් ය. මහායානික ස්තූපයක් තුළ මෙම ධ්‍යානී බුදුවරුන්ගේ රූපයක් සිවු දිශාවන්හි නිරූපණය කොට ඇත. නමුත් එම ස්තූපයන්හි සාමාන්‍යයෙන් වෛරෝචන බුදුන්ගේ රූප හමු නො වේ. ස්තූපය තුළ බුදුවරුන්ගේ රූපයක් සකසන විට නැගෙනහිර දිශාවට අක්ෂෝභ්‍ය බුදුරදුන්ගේ මුව ද දකුණට රත්නසම්භව බුදුරදුන්ගේ මුව ද බටහිරට හා උතුරට පිළිවෙළින් අමිතාභ හා අමෝඝසිද්ධි යන බුදුවරුන්ගේ රූපය ද යොදා ඇත (විමලඥාණ හිමි, 2014, පි. 132).

**අමිතාභ බුදුන්වහන්සේ**

ධ්‍යානී බුදුවරුන් අතරින් පළමු බුදුරදුන් වශයෙන් සලකනු ලබන්නේ අමිතාභ බුදුරදුන් ය. නමුත් උන්වහන්සේගේ සම්භවය සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරක් මූලාශ්‍රය තුළ සඳහන් නො වේ. අනන්ත වූ ආයුෂ චින්දනය කරනු ලබන යන අදහසින් අමිතායුෂ් වශයෙන් ද හඳුන්වනු ලබන අමිතාභ බුදුන් අමරණීයත්වයට හා ආලෝකයට සංකේතයක් වශයෙන් ද තන්ත්‍රයානයේ විස්තරව ඇත. අමිතාභ බුදුරදුන් පිළිබඳ තොරතුරු සඳහන් කරන සුඛාවතීව්‍යුහ සූත්‍රයෙහි සියලු සත්ත්වයන් නිවන් දකින තෙක් අමිතාභ බුදුන් සුඛාවතියේ වැඩවාසය කරන බව සඳහන්ව ඇත. කිසිදු අවස්ථාවක පඤ්චානන්තරිය පාපකර්ම

නො කරන උන්වහන්සේ සෑම සත්ත්වයෙකුගේ ම මරණාසන්න මොහොතෙහි ඔවුන්ගේ සිත් ව්‍යාකූල නො වීම පිණිස පෙනී සිටිති.

මුද්‍රාව - ධර්මචක්‍රය
වර්ණය - සුදු
දිශාව - මධ්‍ය කේන්ද්‍රය
වාහනය - මකරා
කුලය - බුද්ධ
සංකේතය - වජ්‍රය
ස්කන්ධය - විඥානස්කන්ධය
ආයතනය - රූප ආයතනය
ධාතු - ආකාශය
ස්ත්‍රී ශක්තිය - විශ්වණී දෙවඟන
මානුෂික බුදුන් - කකුසඳ බුදුරදුන්
ධ්‍යානී බෝධිසත්ත්ව - සමන්තභද්‍ර ධ්‍යානී බෝධිසත්ත්වයන්

**අක්ෂෝභ්‍ය බුදුන්වහන්සේ**

පූර්ව දිශාවට අධිපති වශයෙන් හඳුන්වනු ලබන්නේ අක්ෂෝභ්‍ය බුදුන්වහන්සේ ය. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ හා සුඛාවතීව්‍යූහ සූත්‍රයෙහි ද මෙම බුදුරදුන් පිළිබඳ ව සඳහන් වේ. මඤ්ජු ශ්‍රී බෝසතුන්ගේ ඔටුන්නෙහි අක්ෂෝභ්‍ය බුදුරදුන්ගේ ප්‍රතිමාවක් දැකගත හැකි අතර ඉන් මඤ්ජු ශ්‍රී බෝසතුන්ට අයත් ධ්‍යානී බුදුරදුන් මුන්වහන්සේ බව හඳුනාගත හැකි ය. අන් සියලු ධ්‍යානී බුදුවරුන් මෙන් මුන්වහන්සේ ද පර්යංකාසනාරූඪ ව වැඩ හිඳී. එමෙන් ම වමතින් ධ්‍යාන මුද්‍රාව ද දකුණින් භූමි ස්පර්ශ මුද්‍රාව ද අක්ෂෝභ්‍ය බුදුරදුන්ගේ ප්‍රතිමාවෙන් නිරූපණය කර තිබීම සුවිශේෂී ලක්ෂණයකි.

මුද්‍රාව - භූමි ස්පර්ශ
දිශාව - නැගෙනහිර
වර්ණය - නිල්
කුලය - වජ්‍ර කුලය
වාහනය - ඇතා
ධාතු - වායු

ස්කන්ධය - රූපස්කන්ධය
සංකේතය - වජ්‍රය
මානුෂික බුදුන් - කෝණාගම බුදුරදුන්
ධ්‍යානී බෝධිසත්ත්ව - වජ්‍රපාණී ධ්‍යානී බෝධිසත්ත්වයන්
ආයතනය - ස්පර්ශ ආයතනය
ස්ත්‍රී ශක්තිය - ලෝචනා දෙවඟන

**රත්නසම්භව බුදුන්වහනසේ**

රත්නසම්භව බුදුන්වහන්සේගේ ප්‍රභවය සම්බන්ධයෙන් මූලාශ්‍රයාගත තොරතුරු අප්‍රකට ය. නාමමාත්‍රික ව පමණක් මහායාන සූත්‍ර සාහිත්‍ය තුළ කරුණු දක්වා තිබූ මුන්වහන්සේට පුනර්ජීවය ලබා දී ඇත්තේ වජ්‍රයානික ඉගැන්වීම් තුළිණි. ධ්‍යානී බුදුවරුන් අතරින් තුන්වන ස්ථානය හිමිවන මුන්වහන්සේ වරද මුද්‍රාවෙන් වැඩසිටින අතර තාන්ත්‍රික විස්වාසයන්ට අනුව දකුණු දිශාව නියෝජනය කරනු ලබයි.

මුද්‍රාව - වරද මුද්‍රාව
වර්ණය - කහ
දිශාව - දකුණු
ධාතු - අග්නි
කුලය - රත්න කුලය
වාහනය - අශ්වයා
ස්කන්ධය - සංඥාස්කන්ධය
ආයතනය - ශබ්ද ආයතනය
ස්ත්‍රී ශක්තිය - මාමකී දෙවඟන
මානුෂික බුදුන් වහන්සේ - කාශ්‍යප බුදුරදුන්
ධ්‍යානී බෝධිසත්ත්ව - රත්නපාණී බෝධිසත්ත්ව

**අමෝඝසිද්ධි බුදුන්වහන්සේ**

ධ්‍යානී බුදුවරුන් අතරින් පස්වන ස්ථානය හිමිවන අමෝඝසිද්ධි බුදුන්වහන්සේ අසීමිත බුද්ධ බලයකින් හා නො වරදින ශ්‍රේෂ්ඨ මන්ත්‍ර බලයකින් යුක්ත යැයි තන්ත්‍රයානයේ සලකනු ලබයි. මෙහි උන්වහන්සේගේ නමෙහි සිද්ධි යන්නෙන් සිතේ හෝ බුද්ධියේ

උත්තරීතර මානුෂික ගුණ නිපදවීම යන්න ද අමෝඝ යන්නෙන් මහවැසි වැටුනු විට වසා තිබූ දොරවල් විවෘත කිරීමෙන් ජලාශවල ජලය ගලායන්නාක් මෙන් නොයෙක් අරමුණු කෙරෙහි විපිළිසර වූ සිත ඒකාග්‍රතාවට හැරවීමේ සිද්ධි ශක්තිය යන්න ද අර්ථවත් වේ. උතුරු දිශාවට අධිපති වශයෙන් සලකනු ලබන මුන්වහන්සේ ඇතැම් අවස්ථාවල අමිතාභ බුදුන්වහන්සේගේ මූර්තියක් ලෙස දක්වා ඇත.

මුද්‍රාව - අභය
ස්ත්‍රී ශක්තිය - තාරා දෙවඟන
දිශාව - උතුරු
ආයතනය - රසායතනය
කුලය - කර්ම කුලය
වාහනය - ගරුඩ
සංකේතය - විශ්ව වජ්‍ර
වර්ණය - කොළ
ස්කන්ධය - වේදනාස්කන්ධය
ධාතු - පඨවි
මානුෂික බුදුන් - මෛත්‍රී බුදුරදුන්
ධ්‍යානී බෝධිසත්ත්ව - විශ්වපාණී බෝධිසත්ත්වයන්

**වෛරෝචන බුදුන්වහන්සේ**

වෛරෝචන යනු බුද්ධ රශ්මිය පතුරවනු ලබන බුදුන්වහන්සේ ය. අවකාශයෙහි අන්ධකාරය දුරුකරමින් ආලෝකය පතුරුවා වෛරෝචන බුද්ධ සංකල්පය සූර්ය වන්දනාවේ පරිණාමයක් වශයෙන් හෝ අවිද්‍යාව නම් වූ අන්ධකාරය දුරුකිරීමේ පරමාර්ථ ධර්මයක් වශයෙන් තන්ත්‍රයානික ඉගැන්වීම් තුළ වර්ධනය වී ඇත (සුගතසිරි හිමි මඩිහේ, 2017: පි. 63). එමෙන් ම උන්වහන්සේ ධර්මචක්‍ර මුද්‍රාවෙන් මධ්‍ය කේන්ද්‍රගත ව වැඩහිඳී. ඇතැම් තැන්වල වෛරෝචන බුදුන්ගේ හා අක්ෂෝභ්‍ය බුදුන්ගේ වෙනස්වීමක් ද තාන්ත්‍රික මණ්ඩල තුළ දක්නට ලැබේ.

මුද්‍රාව - ධර්මචක්‍රය
වර්ණය - සුදු

දිසාව - මධ්‍ය කේන්ද්‍රය
වාහනය - මකරා
කුලය - බුද්ධ කුලය
සංකේතය - චක්‍රය
ස්කන්ධය -විඥානස්කන්ධය
ආයතනය - රූප ආයතනය
ධාතු - ආකාශ
ස්ත්‍රී ශක්තිය - විශ්වණී දෙවඟන
මානුෂික බුදුන් - කකුසඳ බුදුරදුන්
ධ්‍යානී බෝධිසත්ත්ව - සමන්තභද්‍ර ධ්‍යානී බෝධිසත්ත්ව

**පඤ්චධ්‍යානී බුදුවරුන් සතු ඥාන හා සමාධි**

තන්ත්‍රයානය තුළ බුද්ධ සංකල්පය වර්ධනය වීම හුදු ආගමික අර්ථයෙන් පමණක් නොව දාර්ශනික පසුබිමක් ඔස්සේ ද වර්ධනය වී ඇත. විශේෂයෙන් බුදුසමයේ අවධාරිත මූලික ධර්ම සංකල්ප ද පඤ්ච ධ්‍යානී බුද්ධ සංකල්පය ඔස්සේ විස්තර කිරීමට උත්සාහ ගෙන ඇති බව තාන්ත්‍රිය මූලාශ්‍රය අධ්‍යයනය කිරීමෙන් දැකගත හැකි ය. ඒ අනුව අද්වය වජ්‍ර සංග්‍රයෙහි එක් එක් බුදුවරයන් තුළ පස් වැදෑරුම් ඥානයක් පවතින බව සඳහන් කර තිබේ.

- අක්ෂෝභ්‍ය බුදුන්වහන්සේ - ආදර්ශ ඥානය
- රත්නසම්භ බුදුන්වහන්සේ - සමතා ඥානය
- අමිතාභ බුදුන්වහන්සේ - ප්‍රත්‍යවේක්ෂණ ඥානය
- අමෝඝසිද්ධි බුදුන්වහන්සේ - කෘත්‍යානුෂ්ඨාන ඥානය
- වෛරෝචන බුදුන්වහන්සේ - සුවිසුද්ධ ධර්ම ධාතු ඥාන

පඤ්චධ්‍යානී බුදුවරුන් සතු මෙම පස්වැදෑරුම් ඥානයන් වජ්‍රසත්ත්වයන් විසින් වර්ධනය කරනු ලැබේ. සියලු බුදුවරුන් අතරින් වජ්‍රසත්ත්වයන් මූලිකත්වයෙහිලා සලකනු ලබන්නේ ද මෙම නිසාම ය. ඉහත සඳහන් කරන ලද ආදර්ශ ඥානයට අනුව ලෝකයේ සියල්ල මායාවක් බව අවබෝධ කරගැනීමට හැකි වේ. සමතා ඥානයෙන් සිදුවන්නේ ලෝකයේ සියලු සත්ත්වයෝ එක හා සමාන බව වටහා ගැනීමයි. එමෙන් ම ප්‍රත්‍යවේක්ෂණ ඥානයෙන් ලෝකයේ සාමාන්‍ය

හා ස්වලක්ෂණය අවබෝධ කරගැනීමට හැකි අතර කෘත්‍යානුෂ්ඨාන ඥානයෙන් තමා හා අන්‍යයන් පිළිබඳ භේදයෙන් තොර ව සත්‍යාවබෝධය කිරීමට අවශ්‍ය මාර්ගය සැකසේ. ඉහත සඳහන් කරන ලද ඥාන මාර්ගයන් හතර ම අවබෝධ කරගැනීම සඳහා උපකාරී වන පස්වන ඥාන මාර්ගය වන්නේ සුවිසුද්ධ ධර්මධාතු ඥානයයි. තාන්ත්‍රික ඉගැන්වීම්වලට අනුව මෙම පස්වන ඥානය නිර්වාණය එසේත් නොමැතිනම් සියලු කෙලෙස් ප්‍රහීන කිරීමේ උත්කෘෂ්ට මානසික ස්වභාවයට සමාන ය.

පඤ්චධ්‍යානීබුද්ධ සංකල්පය තන්ත්‍රයානය තුළ වැඩී යාමත් සමඟ ඒ සඳහා එක් වූ තවත් දර්ශනික අදහසක් ලෙස පස් ආකාර වූ ධ්‍යාන සමාධීන් පෙන්වා දිය හැකි ය. මෙම ධ්‍යාන සමාධි පහ පිළිවෙලින් බුද්ධත්වය ලබා ගැනීම සඳහා හේතුවන අතර සමාධී ධ්‍යානයන්හි අවසාන අවස්ථාවේදී වජ්‍රසත්ත්ව තත්වයට පත්වේ.

- ඥාන ප්‍රදීප සමාධි
- සර්ව තථාගත සමයසම්භව වජ්‍ර සමාධි
- සර්ව තථාගත රත්නසම්භව වජ්‍ර සමාධි
- සර්ව තථාගත මහාරාජසම්භව වජ්‍ර සමාධි
- සර්ව තථාගත අමෝඝසමයසම්භව වජ්‍ර සමාධි

**පඤ්චධ්‍යානී බුදුවරුන් උදෙසා මණ්ඩල නිර්මාණ කිරීම හා බුදුවරුන් දිශා වශයෙන් ස්ථානගත කිරීම**

තන්ත්‍රයානය තුළ මණ්ඩල නිර්මාණය කිරීම පඤ්චධ්‍යානීබුද්ධ සංකල්පය මුල්කර ගනිමින් ද නිර්මාණය වේ. මෙම මණ්ඩල සහිත රූප සටහන් තුළ පුද්ගලයාට විශ්වයට හා පඤ්චධ්‍යානී බුදුවරුන්ට නියමිත ස්ථාන හා සංකේතයන් නිරූපණය වන අතර ඊට අනුව සියලු අක්ෂරයන් සහ වර්ණයන් යොදාගනු ලබයි (සාරානන්ද හිමි එළමල්දෙණියේ, 2019: පි. 68). මෙසේ නිර්මාණය කරගන්නා මණ්ඩල බෙහෝ දුරට කසිණ අරමුණක් හා සමාන වේ. එමගින් තමන් ඇතුළු සමස්ත විශ්වය ම මවා ගැනීමට හැකිවනවා පමණක් නොව මණ්ඩලය ආධාරයෙන් ධ්‍යාන වැඩීම කරණකොට ගෙන යෝගියා අපේක්ෂා

කරනු ලබන වජ්‍රසත්ත්ව තත්ත්වයට ද පත්විය හැකි ය. තන්ත්‍රයානය තුළ පඤ්චධ්‍යානී බුදුවරුන් විෂයෙහි මණ්ඩල නිර්මාණය කිරීමේ දී ඒ ඒ බුදුවරුන් උදෙසා දිශාවන් ද නම්කොට තිබීම දැකගත හැකි ය. මෙසේ දිශාවන් සඳහා බුදුවරුන් නම් කිරීම ගුහ්‍ය සමාජ තන්ත්‍රයේ දී හඳුන්වා ඇත්තේ ධ්‍යානී බුද්ධ මණ්ඩලය යනුවෙනි (සාරානන්ද හිමි එළමල්දෙණියේ, 2019: පි. 69). විශේෂයෙන් විවිධ දිශාවන් සඳහා බුදුවරුන් නම් කිරීමේ දී මණ්ඩලය තුළ බුදුරජාණන් වහන්සේලා ඇතැම් අවස්ථාවන්හි දී එක ම වර්ණයකින් හෝ එක ම දිශාවකට සම්බන්ධ කොට දක්වා නො තිබිය හැකි ය. පහත දක්වා ඇත්තේ වෛරෝචන මණ්ලය තුළ විවිධ දිශාවන් සඳහා බුදුවරුන් නම් කොට ඇති ආකාරයයි.

- අමෝඝසිද්ධි බුදුරදුන් (උතුර)
- අක්ෂෝභ්‍ය බුදුරදුන් (නැගෙනහිර)
- වෛරෝචන බුදුරදුන් (ප්‍රධානියා)
- රත්නසම්භව බුදුරදුන් (දකුණ)
- අමිතාභ බුදුරදුන් (බටහිර)

**සමාලෝචනය**

බුද්ධ පරිනිර්වාණයත් සමඟ නිර්මාණය වූ පශ්චාත්කාලීන මහාසංඝික ආදී බෞද්ධ ගුරු කුලයන් බුද්ධ සංකල්පය ආශ්චර්යවත් අන්දමින් ගොඩ නැගීමට උත්සාහ ගත් අතර එම ප්‍රයත්නයන්හි සුවිශේෂී සන්ධිස්ථානයක් වශයෙන් තාන්ත්‍රික ඉගැන්වීම්හි එන පඤ්චධ්‍යානීබුද්ධ සංකල්පය හඳුන්වාදිය හැකි ය. මෙම පඤ්චධ්‍යානීබුද්ධ සංකල්පය මඟින් මහායානයේ අසීමිත බුදුවරුන් ප්‍රමාණය සංඛ්‍යාත්මක ව අඩුකොට තාන්ත්‍රික රහස්‍යභාවය ඇතිවන පරිදි විශ්වය පිළිබඳ සංකේතාත්මක වූත් සංකීර්ණ ඉගැන්වීම් ඉදිරිපත් කොට ඇත. එසේ ම පඤ්චධ්‍යානී බුදුවරුන් විෂයෙහි සකසන ලද මණ්ඩලයන් හරහා යෝග භාවනාවේ යෙදෙන යෝගාවචරයා හට සුවිශේෂී වූ කසිණාරම්භයක් ද ඇති කර ගැනීමට හැකිවීම සුවිශේෂී කරුණකි.

## ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය


ප්‍රාථමික මූලාශ්‍ර

දීඝ නිකාය ii, (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල.

දීඝ නිකාය iii, (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල.

මජ්ඣිම නිකාය i (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල.

මජ්ඣිම නිකාය ii, (2005), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල.

ද්විතීයික මූලාශ්‍ර

ධම්මජෝති හිමි, මැදවච්චියේ, (2011), මහායානයේ මූලික සංකල්ප, විජේසූරිය ග්‍රන්ථකේන්ද්‍රය, මුල්ලේරියාව.

සාරානන්ද හිමි, එළමල්දෙණියේ, (2019), වජ්‍රයානය සහ ටිබෙට් බුදුසමය, ගොඩගේ සහ සයෝදරයෝ, කොළඹ 10.

සුගතසිරි හමි, මඩිහේ, (2017), උතුරු බුදුදහම, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

විමලඤාණ හිමි, නාඹටුන්නේ, (2014), තාන්ත්‍රික බුදුසමය, කර්තෘ ප්‍රකාශන,